# අවිධිමත් මාලඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පිළිබඳ වාර්තාව

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය (GMOA)
2010

සාමාජිකයින් අතරේ බෙදා හැරීම සඳහා පමණි

# පටුන

**මාතෘකාව** **පිටු අංකය**


- ❖ අභිමතාර්ථ 01
- ❖ විධායක සාරාංශය 02
- ❖ මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනය විවිධ අංශ කෙරෙහි ඇති කරන බලපෑම රූප සටහන් මඟින් 03

1. මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනය 04

2. රාජ්‍ය ප්‍රතිපත්තිය 04

3. වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය 04
   - 3.1 ශ්‍රී ලංකා වෛද්‍ය සභාව 04
   - 3:2 ලොවම ප්‍රතික්ෂේප කල නිවුන් වෛද්‍ය පාඨමාලාවන් 04
   - 3:3 මාලඹේ ආයතනය මඟින් ලබා දෙන වෛද්‍ය උපාධියේ මව් විශ්ව විද්‍යාලයේ තත්වය 04

4. මාලඹේ වෛද්‍ය ආයතනයේ නීතිමය පසුබිම 05
   - 4:1 ආයෝජන මණ්ඩලයට පටහැනි බව 05
   - 4:2 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවට පටහැනි බව 05
   - 4:3 ශ්‍රී ලංකා වෛද්‍ය ආඥා පනතට පටහැනි බව 05
   - 4:4 රුසියානු වෛද්‍ය සභාවේ අනුමැතිය නොමැති බව 05

5. වෛද්‍ය විද්‍යාලයකට අවශ්‍ය යටිතල පහසුකම් නොමැති මාලඹේ වෛද්‍ය ආයතනය 06
   - 5:1 සායනික පුහුණුව සඳහා රෝහල් නොමැත 06
   - 5:2 විධිමත් ආචාර්ය මණ්ඩලයක් නොමැති වීම 06
   - 5:3 අඩු ප්‍රමිතියෙන් යුත් පාඨමාලා ව්‍යුහය 06

6. අඩු ප්‍රමිතියකින් යුත් වෛද්‍ය විද්‍යාල පිහිටුවීම හා එහි ප්‍රතිවිපාක 07
   - 6.1 ජාතික සෞඛ්‍ය පද්ධතියට ඇති බලපෑම 07
   - 6.1.1. ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන්ගේ කීර්තිනාමය හානි වීම 07
   - 6.1.2 ඉහළ සෞඛ්‍ය දර්ශක පවත්වාගෙන යාම 07
   - 6.2 දේශීය ආර්ථිකයට ඇති බලපෑම 07
   - 6.2.1 රටක් වශයෙන් කීර්තිනාමයට සිදුවන හානිය 07
   - 6.2.2. සංචාරක කර්මාන්තයට ඇති බලපෑම 07
   - 6.2.3 පුහුණු ශ්‍රමිකයන් හරහා විදේශ විනිමය ඉපැයීමේදී මතුවන ගැටළු 07
   - 6.2.4 ව්‍යාජ අධ්‍යාපන ආයතන වලට හසුවන සිසුන් හා දෙමාපියන් මුහුණපාන ගැටළු 08
   - 6.2.5 දේශීය මුදල් රුසියාවට ඇදී යෑම 08
   - 6.3 ශ්‍රී ලාංකීය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනයට කිසිදු දායකත්වයක් නොමැත 08
   - 6.3.1 යටිතල පහසුකම් දියුණු වීමක් නොමැත 08
   - 6.3.2 සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නව රැකියා අවස්ථා බිහි කිරීමට අත්වැලක් නොමැත 08
   - 6.3.3 රෝගීන් සඳහා කිසිදු පහසුවක් නොලැබීම 08
   - 6.4 රජයේ වෛද්‍ය විද්‍යාල සඳහා ඇති බලපෑම 09
   - 6.4.1 ආචාර්ය මණ්ඩලය හිඟවීම 09
   - 6:4:2 සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පුරප්පාඩු සීඝ්‍රයෙන් සංතෘප්ත වීම 09
   - 6:4:3 වෛද්‍ය සිසුන් නොසන්සුන් වීම 09

7. අධ්‍යාපනික ක්ෂේත්‍රයට ඇති බලපෑම 09
   - 7.1 පැහැදිලි විෂමතාව තුලින් පාසැල් සිසුන් කලකිරීමට පත්වීම 09

8. දැනට බඳවාගෙන ඇති සිසුන්ගේ හා ඔවුන්ගේ උගත් දෙමාපියන්ගේ වගකීම් විරහිත හැසිරීම් රටාව 10
   - 8.1 රජයේ රෙගුලාසි සඳහා අවනත නොවීම 10
   - 8.2 සිසුන් බඳවාගෙන කලක් ගත වීමෙන් පසු ලබා ගන්නා අනුමැතිය මුදලින් බඳවාගත් සිසුන් කෙරෙහි බල නොපාන බව 10

- ❖ යෝජනා 11

2010 සැප්තැම්බර් 01 දින පැවැත්වූ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මහා කමිටුවේදී කල යෝජනාවට අනුව පත් කරන්නට යෙදුනු විශේෂ කමිටුව මඟින් ඉදිරි මහ කමිටු වාරයේදී තීන්දු තීරණ ගැනීමට පහසුවීම සඳහා කමිටු සාමාජිකයින් අතරේ බෙදා හැරීමට මෙම වාර්තාව සකසන ලදී.

## අභිමතාර්ථය

මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනයේ තත්වය පිළිබඳ අධ්‍යයනයක් කිරීම.

## කමිටු සාමාජිකත්වය

- වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය
- වෛද්‍ය බිමන්ත ගුණසේකර
- වෛද්‍ය පුෂ්පිත උබේසිරි
- වෛද්‍ය චන්දන අතපත්තු
- වෛද්‍ය චන්දික එපිටකඩුව
- වෛද්‍ය නලින් ආරියරත්න
- වෛද්‍ය චන්දන රම්‍යසිරි
- වෛද්‍ය රුවන් වික්‍රමසිංහ
- වෛද්‍ය මහේෂ් ඇපා
- වෛද්‍ය සමන්ත චන්ද්‍රරත්න
- වෛද්‍ය කසුන් වීරක්කොඩි

පහත දැක්වෙන ආයතන මෙම වාර්තාව සැකසීම සඳහා උපයෝගී කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

වෛද්‍ය සභාව එක්සත් රාජධානිය

වෛද්‍ය සභාව ඔස්ට්‍රේලියාව

මුද්‍රිත ලේඛණ හා වෙබ් අඩවි


## විධායක සාරාංශය

ශ්‍රී ලංකාව තුල පෞද්ගලික වෛද්‍ය පීඨ ඇතුළුව පෞද්ගලික අධ්‍යාපන ආයතන පිහිටවීම රජයේ ප්‍රතිපත්තිය බව උසස් අධ්‍යාපන අමාත්‍යවරයා ප්‍රකාශ කර ඇත. තවද ජනතා විමුක්ති පෙරමුණ හැරුණු කල අනෙකුත් සියළු දේශපාලන පක්ෂද මෙම ප්‍රතිපත්තියේ පිහිටා ඇති බව ඔහු පවසයි. කෙසේ නමුත් එම උසස් අධ්‍යාපන ආයතන රටේ පවත්නා නීතිමය රාමුව හා වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය ආරක්ෂා වන පරිදි පිහිටුවීම සිදුකළ යුතුව ඇත. තවද එම ආයතන ශ්‍රී ලංකාවේ ආර්ථිකය, අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවාව යන අංශයන්හි ප්‍රවර්ධනයට මඟ පෑදිය යුතුය.

දැනට පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ලෙස පවත්වාගෙන යන මාලඹේ අධ්‍යාපන ආයතනය ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් අනුමත කොට ඇති නිර්ණායකයන් කිසිවක් ලබා ගැනීමට අපොහොසත් වී ඇත. එපමණක් නොව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ලිපි මඟින් හා පුවත්පත් දැන්වීම් මඟින් එම ආයතනයට කරන ලද අනතුරු ඇඟවීම් සියල්ල නොසලකා හැර ඇත. එපමණක් නොව මෙම ආයතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ හෝ වෙනත් කිසිදු නීතිමය අවසරයක් ලබා ගෙන නොමැත. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව දක්වා ඇති පරිදි වෛද්‍ය විද්‍යාලයකට සිසුන් බඳවා ගැනීමට ප්‍රථම රෝහල් සංකීර්ණයක් ඇතුළු තවත් මූලික අවශ්‍යතා ගණනාවක් සපුරා ගත යුතුය. මෙම ආයතනය එවන් රෝහල් සංකීරණයක් ඉදිකරන බවට දිනයක් සඳහන් නැති ලිපියකින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට පොරොන්දු වී ඇතත් මේ දක්වා ඉදි වූ රෝහලක් දැක ගැනීමට නොමැත. එනමුත් මෙම ආයතනය වසරක කාලයක් ඇතුලත සිසුන් 50 බැඟින් වූ ශිෂ්‍ය කණ්ඩායම් 3ක්, එක් අයෙකුගෙන් ලක්ෂ 65 බැඟින් අය කරමින් බඳවා ගෙන ඇත.

මේ ආකාරයට ප්‍රමිතියකින් හෝ නිසි අවසරයකින් තොරව පවත්වාගෙන යන ආයතනයකට ඉතා විශාල ගණනින් මුදල් අය කරමින් සිසුන් බඳවා ගනිමින් සිදුවන ක්‍රියාවලිය රටේ ආර්ථිකය, නීතිමය හා සමස්ථ සෞඛ්‍ය සේවයම මහත් කැළඹීමකට ලක් කරන දිනය වැඩි ඈතක නොවනු ඇත.

**මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනය විවිධ අංශ කෙරෙහි ඇති කරන බලපෑම රූප සටහන් මඟින්**



## 1. මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනය
## (තාක්ෂණය හා කළමණාකරණ පිළිබඳ දකුණු ආසියානු ආයතනය)

වසර 2009 දී ආරම්භ කෙරුණු මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනය මඟින් පවත්වාගෙන යන වෛද්‍ය උපාධියේ ප්‍රථම වසර 4 ශ්‍රී ලංකාවේත් අවසන් වසර රුසියාවේ නිශ්නි නොව්ගොරොඩ් විශ්ව විද්‍යාලයට අනුබද්ධවත් සිදුකිරීමට නියමිතය.

## 2. රාජ්‍ය ප්‍රතිපත්තිය

උසස් අධ්‍යාපන අමාත්‍යවරයා පසුගිය දිනයක පාර්ලිමේන්තුවේදී හා මාධ්‍ය මඟින් මහජනතාවට ප්‍රකාශ කරනුයේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇතුළු පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන රට තුල පිහිටුවීම රාජ්‍ය ප්‍රතිපත්තිය බවය. තවද මෙම ක්‍රියාවලිය හරහා ශ්‍රී ලංකාවේ ආසියාවේ අධ්‍යාපනික කේන්ද්‍රය බවට පත් කරන බවත් රටේ මුදල් අධ්‍යාපනය උදෙසා පිටරටට ගලා යෑම නැවැත්වීමට කටයුතු කරන බවත් පැවසීය.

## 3. වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය

### 3:1 ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යනු වෛද්‍ය අධ්‍යාපනයේ හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමිතිය ආරක්ෂා කරමින් පවත්වාගෙන යාම සඳහා වෛද්‍ය ආඥා පනතේ නො: 24,1924 වගන්තියට අනුකූලව පාර්ලිමේන්තුව මඟින් පිහිටුවා ඇති ආයතනයයි. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට මෙම බලතල පැවරීම තුලින් විධිමත් සෞඛ්‍ය සේවාවක් මහජනතාවට ලබා දීමට රජයට ඇති බැඳීම සම්පූර්ණ වේ.

සියළුම වෛද්‍යවරුන් සඳහා මෙරට වෛද්‍යවරයෙකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය බලපත්‍ර නිකුත් කිරීමේ බලතල ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සතු වන අතර එමඟින් එම වෛද්‍යවරුන් රෝගී ප්‍රතිකාර සේවය සඳහා රටේ ඕනෑම ප්‍රදේශයකට සේවය කිරීමට සුදුසු වෛද්‍යවරුන් බවට තහවුරු කෙරේ. මෙම ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා වෛද්‍ය අධ්‍යාපනය ලබා දීමේ සිට ඉදිරියට ඇති සියළුම කටයුතු ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් පූර්ණ අධීක්ෂණයට ලක්කෙරේ.

### 3:2 ලොවම ප්‍රතික්ෂේප කල නිවුන් වෛද්‍ය පාඨමාලාවන්

වෛද්‍යවරුන්ගේ ප්‍රමිතිය ආරක්ෂා කිරීමේ මූලික පියවරක් ලෙස වෛද්‍ය ආඥා පනත හරහා නිවුන් වෛද්‍ය පාඨමාලාවන් ප්‍රතික්ෂේප කරන අතර ඉන් අදහස් කරන්නේ වෛද්‍ය පාඨමාලාවෙන් කොටසක් උපාධිය ලබා දෙන රටේදී පවත්වා ඉතිරිය වෙනත් රටකදී පවත්වන වෛද්‍ය පාඨමාලාවන්ය. තවද ජාත්‍යන්තර විභාග වලදී ද නිවුන් පාඨමාලාවන් ඔස්සේ ලබා ගත් වෛද්‍ය උපාධි ප්‍රතික්ෂේප කරනු ලැබේ. එක්සත් රාජධානියේ වෛද්‍ය සභාව, ඔස්ට්‍රේලියානු වෛද්‍ය සභාව ඇතුළු ජාත්‍යන්තර වෛද්‍ය නියාමන සභාවන් ඉතා පැහැදිලිව දක්වා ඇති පරිදි නිවුන් පාඨමාලාවන් ඔස්සේ ලබා ගත් වෛද්‍ය උපාධිධාරීන්ට ඔවුන්ගේ බලපත්‍ර විභාග සඳහා සහභාගී වීමට නොහැක.

http://www.gmcuk.org/doctors/registration_applications/acceptable_primary_medical_qualification.asp
http://www.amc.org.au/index.php/img/exam/appinfo

### 3:3 මාලඹේ ආයතනයට ලබා දෙන වෛද්‍ය උපාධියේ මව් විශ්ව විද්‍යාලයේ තත්වය

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් නිකුත් කරන ලද දත්ත වලට අනුව මාලඹේ වෛද්‍ය ආයතනයේ සිසුන්ට වෛද්‍ය උපාධිය ලබා දෙන මව් විශ්ව විද්‍යාලය වන රුසියාවේ නිශ්නි නොව්ගොරොඩ් විශ්ව විද්‍යාලය හරහා දැනට පිටවන වෛද්‍යවරුන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් පවත්වන ACT 16 විභාගයෙන් සමත් වීමේ ප්‍රතිශතය 35% කි. මව් විශ්ව විද්‍යාලයේ ප්‍රතිඵල මෙතරම් පහත මට්ටමක පවතින තත්වයක් තුල තවමත් සිසුන්ට අධ්‍යාපනය ලබා දීමට රෝහලක් හෝ නොමැති මාලඹේ වෛද්‍ය ආයතනයෙන් ඉහළ ප්‍රතිඵල බලාපොරොත්තු වීමට නොහැක.

http://www.srilankamedicalcouncil.org/download/article/8/29a4feb8b84716a385b21704a975f3fd.pdf

## 4. මාලඹේ වෛද්‍ය ආයතනයේ නීතිමය පසුබිම

### 4:1 ආයෝජන මණ්ඩලයට පටහැනි බව

මෑතක් වනතුරු ශ්‍රී ලංකා වෛද්‍ය සභාව හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව ඇතුළු සමස්ථ ජනතාවම විශ්වාස කරනු ලැබුයේ මාලඹේ පිහිටි පෞද්ගලික වෛද්‍ය ආයතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පූර්ණ අනුමැතිය යටතේ පිහිටුවා ඇති ආයතනයක් බවය. නමුත් මෙම සියළු කාණ්ඩ මවිතයට පත් කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ලිඛිතව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට දැනුම් දී ඇත්තේ තම ආයතනය හරහා මාලඹේ අධ්‍යාපන ආයතනයට වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීමට කිසිදු අනුමැතියක් ලබා දී නොමැති බවය.

මේ අනුව පෙනී යන්නේ මෙම මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන හෝ වෛද්‍ය සේවාවේ ප්‍රමිතීන් හෝ රටේ ආර්ථිකය පිළිබඳ තීන්දු තීරණ ගන්නා කිසිදු ආයතනයකින් අනුමැතිය ලබා නොමැති ව්‍යාජ අධ්‍යාපන ආයතනයක් බවය.

### 4:2 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවට පටහැනි බව

විශ්ව විද්‍යාල පනතේ අංක 21 සිට 25 A දක්වා වූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව යටතේ පවතින අධ්‍යාපන ආයතන වලින් කිසිදු ගණයකට මෙම ආයතනය අයත් නොවේ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව පවසන ආකාරයට මෙය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ පවතින ශ්‍රමිකයන් පුහුණු කිරීමේ ආයතනයක් ලෙස පිහිටුවා ඇති නිසා මෙම ආයතනය අධීක්ෂණය කිරීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවට බලතල නොමැත.

http://www.ugc.ac.lk/en/policy/universities-act/29.html

### 4:3 ශ්‍රී ලංකා වෛද්‍ය ආඥා පනතට පටහැනි බව

මාලඹේ පිහිටි පෞද්ගලික වෛද්‍ය ආයතනය ඉහත සඳහන් කල ආකාරයේ නිවුන් පාඨමාලාවක් ලෙස ආර්ම්භ කර ඇති අතර මෙම පසුබිම තුල ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මෙම ආයතනය ප්‍රතික්ෂේප කර ඇත. මේ බව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ලිඛිතව එම ආයතන ප්‍රධානීන්ට හා භාෂා තුනෙන්ම පුවත්පත් දැන්වීම් හරහා මහජනතාවට දැනුම් දී ඇත. එම නිසා දැනට ක්‍රියාත්මක වන මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනය ශ්‍රී ලංකා වෛද්‍ය සභා අනුමැතිය නොලත් ආයතනයකි. නමුත් පුදුමයට කරුණ වනුයේ මෙවන් පසුබිමක පවා එම ආයතනය එක් සිසුවෙකුගෙන් රුපියල් ලක්ෂ 65 බැගින් අය කරමින් දිගින් දිගටම සිසුන් බඳවා ගැනීමේ කටයුතු වල නිරත වීමය.

### 4:4 රුසියානු වෛද්‍ය සභාවේ අනුමැතිය නොමැති බව

ඕනෑම රටක විශ්ව විද්‍යාලයකට පමණක් ස්වකීය කැමැත්ත අනුව තම ආයතනයේ ශාඛා වෙනත් රට වල පිහිටුවීමට නීතිමය අවස්ථාවක් නොමැත. එම ශාඛාව පිළිගත් අධ්‍යාපන ආයතනයක් වනුයේ එය මව් විශ්ව විද්‍යාලය පිහිටි රටේ උසස් අධ්‍යාපනය පිළිබඳ බලතල සහිත ආයතනයෙන් අනුමැතිය ලබා ඇති නම් පමණි. නිශ්නි නොව්ගොරොඩ් විශ්ව විද්‍යාලය ලබා දෙන වෛද්‍ය උපාධිය රුසියානු වෛද්‍ය සභාව මගින් පිළිගනු ලැබුවද කොටසක් රුසියාවේදී හා ඉතිරි කොටස ශ්‍රී ලංකාවේදී අධ්‍යාපන ලබා දෙන පාඨමාලාවට රුසියානු වෛද්‍ය සභා අනුමැතිය නොමැත. මෙම සියළු කරුණු සලකා බැලීමේදී පෙනී යන්නේ මෙම ආයතනය වෛද්‍ය විද්‍යාලයක් මුවාවෙන් සිදු කරන මූල්‍ය වංචාවක් බවය.

## 5. වෛද්‍ය විද්‍යාලයකට අවශ්‍ය යටිතල පහසුකම් නොමැති මාලඹේ වෛද්‍ය ආයතනය

### 5:1 සායනික පුහුණුව සඳහා රෝහල් නොමැත

වෛද්‍ය අධ්‍යාපනය සායනික හා සෛද්ධාන්තික ලෙස මූලික කොටස් දෙකකට බෙදා වෙන් කරන අතර සායනික පුහුණුව ලබා දීමට සුදුසු රෝහල් පද්ධතියක් පැවතීම වෛද්‍ය විද්‍යාලයකට අත්‍යවශ්‍ය වේ. මෙම අවශ්‍යතාව හොඳින් දන්නා මාලඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ නිළධාරීන් ඇඳන් 400කින් යුත් අංග සම්පූර්ණ රෝහලක් සාදා රෝගීන්ට නොමිලයේ ප්‍රතිකාර ලබා දෙන අතරතුර සිය සිසුන්ට සායනික පුහුණුව ලබා දීමට කටයුතු කරන බව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට ලිඛිතව දන්වා ඇත. නමුත් ඔහු බඳවා ගත් පළමු ශිෂ්‍ය කණ්ඩායමට නොබෝ දිනකින් සායනික පුහුණුව ලබා දීමට නියමිතව තිබුනද ඔවුන් පොරොන්දු වූ මෙම අංග සම්පූර්ණ රෝහලට තවමත් මුල් ගලවත් තබා නොමැත.

### 5:2 විධිමත් ආචාර්ය මණ්ඩලයක් නොමැති වීම

වෛද්‍ය විද්‍යාව උගන්වන ආචාර්යවරයෙකු වීමට අවශ්‍ය මූලික සුදුසුකම් ඇත. මෙම මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනයේ දැනට ආචාර්ය මණ්ඩලය ලෙස බඳවාගෙන සිටින වෛද්‍යවරුන් බහුතරයක් විදේශ උපාධිධාරීන් වන අතර මෙම ආයතනයේ අධ්‍යක්ෂක ඇතුළු දැනට ගුරුවරුන් ලෙස පන්ති පවත්වන බහුතරයකට ශ්‍රී ලංකාව තුල වෛද්‍යවරයෙකු ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය බලපත්‍රයක් නොමැත. 01.10.2010 දින මෙම ආයතනයේම වෙබ් පිටුව සඳහන් කරන ආකාරයට මෙම ආයතනය සතුව සිටිනුයේ එක් මහාචාර්යවරයෙකු හා කොන්ත්‍රාත් පදනම මත පැමිණෙන මහාචාර්යවරුන් දෙදෙනෙකු පමණි.
http://www.saitm.edu.lk/faculty-medicine/staff

### 5:3 අඩු ප්‍රමිතියෙන් යුත් පාඨමාලා ව්‍යුහය

මාලඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය සතුව පවතින්නේ නිසි ප්‍රමිතියකින් යුත් වෛද්‍ය අධ්‍යාපනයක් ලබා දීමට වෛද්‍ය විද්‍යාලයක් සතු විය යුතු මූලික දෙපාර්තමේන්තු 20න් 3ක් පමණකි. නමුත් මෙතෙක් කිසිදු වෛද්‍ය පීඨයක නොමැති ඉතිහාසය, දර්ශනවාදය, භාෂාව වැනි විවිධ ව්‍යාජ දෙපාර්තමේන්තු පිහිටුවමින් ආයතනයට ව්‍යාජ පිළිගැනීමත් ලබා දීමට එහි පරිපාලනය කටයුතු කර ඇති බව පෙනේ.
http://www.cmb.ac.lk/academic/medicine/departments.html
http://www.saitm.edu.lk/faculty-medicine/staff

## 6. අඩු ප්‍රමිතියකින් යුත් වෛද්‍ය විද්‍යාල පිහිටුවීම හා එහි ප්‍රතිවිපාක

### 6.1 ජාතික සෞඛ්‍ය පද්ධතියට ඇති බලපෑම

#### 6.1.1. ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන්ගේ කීර්තිනාමය හානි වීම

අද වන විට ශ්‍රී ලාංකිය වෛද්‍යවරුන්ට ලොව පුරා ඉතා උසස් පිළිගැනීමක් ඇති අතර ඔවුන්ගේ සුදුසුකම් හා දක්ෂතාවන් ඉතා ඉහළ ලෙස අගය කිරීමකට ලක්වේ. මීට ප්‍රධානතම හේතුව වන්නේ මෙරට විභාග වලින් ඉහළම ලකුණු ලැබූ සිසුන් වෛද්‍ය පීඨ සඳහා ඇතුලත් කරගැනීමත්, ඔවුන්ට මනා අධ්‍යාපනයක් හා පුහුණුවක් ලබා දීමත්ය. නමුත් ප්‍රමිතියකින් තොර පෞද්ගලික වෛද්‍ය විද්‍යාල හරහා ඉන් පිටවන ගුණාත්මක බවින් අඩු වෛද්‍යවරුන් හේතු කොටගෙන දැනට ඇති කීර්තිනාම දැඩි ලෙස පරිහානියට පත්වනු ඇත.

#### 6.1.2 ඉහළ සෞඛ්‍ය දර්ශක පවත්වාගෙන යාම

කලාපයේ අනෙකුත් රටවල් හා සංවර්ධනය වෙමින් පවතින රටවල් අතුරින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය දර්ශක ඉතා ඉහළ මට්ටමක පවතින බව ලොවම පිළිගත් කරුණකි. මාතෘ මරණ අනුපාතය, ළදරු මරණ අනුපාතය, ප්‍රතිශක්තිකරණය වැනි සෞඛ්‍ය තත්ව දර්ශක අතින් ලංකාව දියුණු රටවල් හා සම මට්ටමක සිටී. මීට බලපාන එක් ප්‍රධාන කරුණක් වන්නේ වෛද්‍ය වෘත්තිකයන්ගේ දක්ෂතාව හා කැපවීමය. නමුත් ලාභය මුල් තැන කරගත් පෞද්ගලික වෛද්‍ය ආයතන මගින් බිහිවන වෛද්‍යවරුන් හරහා වර්තමාන ප්‍රමිතියේ අඩාල වීම වැළැක්විය නොහැක.

### 6.2 දේශීය ආර්ථිකයට ඇති බලපෑම

#### 6.2.1 රටක් වශයෙන් කීර්තිනාමයට සිදුවන හානිය

ආසියාවේ අධ්‍යාපනික කේන්ද්‍රය බවට ශ්‍රී ලංකාව පත්කිරීම රජයේ අභිලාෂය වේ. මෙම ඉලක්කය වෙත ළඟා වීම සඳහා විදේශ සිසුන් ලංකාව වෙත ආකර්ශනය කර ගැනීමට නම් දැනට පවතින ආයතනයන්හි පහසුකම් වැඩි දියුණු කිරීම, ප්‍රමිතියෙන් හා ගුණාත්මක බවින් ඉහළ ආයතන පිහිටු වීමත් සිදුකළ යුතුව ඇත. නමුත් මෙරට බිහිකරන ප්‍රථම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට මෙවන් බාල ප්‍රමිතියකින් යුතු ආයතනයක් වීම හරහා අනාගතයේදී හෝ මෙරට අධ්‍යාපනය ලබා ගැනීමට විදේශ සිසුන් පැමිණීම වැළැක්වෙනු ඇත. තවද මුල් ආයතනය මෙසේ වූ විට අනාගතයේ බිහි වන ආයතන මීටත් වඩා පහළ මට්ටමකට වැටෙනු ඇත.

#### 6.2.2. සංචාරක කර්මාන්තයට ඇති බලපෑම

ශ්‍රී ලංකාව ආසියාවේ ආර්ථික කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමට රජය ගෙන යන වැඩපිළිවෙලෙහි සෞඛ්‍ය ක්ෂේත්‍රයට ප්‍රමුඛස්ථානයක් හිමිවේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උසස් මට්ටම හා වෛද්‍යවරුන්ගේ කුසලතා සම්බන්ධයෙන් ඉහළ නමක් ලබා ඇති රටක් වශයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉහළ නමක් ලබා ඇති රටක් වශයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය කර්මාන්තයක් ලෙස දියුණු කිරීමට එමගින් මහත් වූ විදේශ විනිමයක් ශ්‍රී ලංකාවට එකතු කරගැනීමටත් අගනා අවස්ථාවක් ඇත. මෙය තවමත් හොඳින් අත්හදා බලා නොමැති නමුත් ඉහළ ශක්‍යතාවක් ඇති ආදායම් මාර්ගයකි. නමුත් ප්‍රමිතියෙන් අඩු වෛද්‍යවරුන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට එකතු වීම මඟින් ඉහත අවස්ථාව අභියෝගයට ලක්වන අතර එය විදේශ විනිමය උපයන මාර්ගයක් ලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කිරීමේ කාර්යයට සෘජුවම බලපානු ඇත.

#### 6.2.3 පුහුණු ශ්‍රමිකයන් හරහා විදේශ විනිමය ඉපැයීමේදී මතුවන ගැටළු

මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය විදේශ කටයුතු අමාත්‍යාංශය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය හා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය එක්ව ශ්‍රී ලාංකිය වෛද්‍යවරුන් විදෙස් රටවල කෙටි කලකට සේවයේ යෙදවීමෙන් විදේශ විනිමය ඉපයීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කර ඇත. මෙරට වෛද්‍යවරුන්ට ලොව පුරා ඇති ඉහළ ඉල්ලුම නිසා මේ වන විටත් රටවල 15කට ආසන්න සංඛ්‍යාවකින් මෙරට වෛද්‍යවරුන් සේවයේ යෙදවීම කැමැත්ත ප්‍රකාශ කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස නොබෝ දිනකින් ලාංකිය වෛද්‍යවරු 1000ක් වසර 2ක සේවා කාලයක් සඳහා ලිබියාවට යාමට නියමිතව ඇත. මෙවන් ඉහළ ඉල්ලුමක් ලාංකිය වෛද්‍යවරුන්ට ලැබී ඇත්තේ ජාත්‍යන්තරව ඔවුන්ට

ඇති ඉහළ පිළිගැනීම නිසා වන අතර එම ප්‍රමිතියට හානි කරමින් ඌන ප්‍රමිතියෙන් යුත් වෛද්‍යවරුන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට එක්වීම හරහා මෙරට වෛද්‍යවරුන්ට ඇති ඉල්ලුම සීඝ්‍රයෙන් පහළ යනු ඇත.
*Health Sector Contribution to Knowledge Economy – Concept of skilled labour exportation and knowledge economy – ISBN 978-955-1928-00-1*

### 6.2.4 ව්‍යාජ අධ්‍යාපන ආයතන වලට හසුවන සිසුන් හා දෙමාපියන් මුහුණපාන ගැටළු

මෑත ඉතිහාසයේ ඉතා විශාල පිරිසක් මහා පරිමාණයේ මූල්‍ය වංචාවන්ට හසු වී අපහසුතාවට පත්ව ඇත. මහජනතාව අහස උසට බලාපොරොත්තු ලබා දී ඔවුන්ගෙන් මුදල් ලබාගෙන නිමේශයකින් අතුරුදහන් වූ සක්විති, දඬුවම් මුදලාලි වැන්නවුන් තවමත් අපට අමතක වී නොමැත. වෛද්‍ය විද්‍යාලයක් සඳහා කිසිදු නීතිමය අවසරයකින් තොරව දැනට මාලඹේ පවත්වාගෙන යන අධ්‍යයන ආයතනය දැනටමත් සිසුන්ගෙන් මිලියන 300කට අධික මුදලක් ලබාගෙන ඇත. කල්තියා හඳුනාගත හැකි මෙවන් මූල්‍ය වංචා සඳහා නිසි ක්‍රියාමාර්ග නොගැනීමෙන් දිනක රජය අපහසුතාවයට පත්වනවා පමණක් නොව තරුණ තරුණියන් 150කගේ පමණ කාලය නිකරුනේ නාස්ති වීමක්ද සිදුවේ.

### 6.2.5 දේශීය මුදල් රුසියාවට ඇදී යැම

අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා දේශීය මුදල් වෙනත් රටවලට ඇදී යාම වැළැක්වීම රාජ්‍ය ප්‍රතිපත්තිය වේ. නමුත් මෙම මාලඹේ පිහිටි පෞද්ගලික වෛද්‍ය ආයතනය සිසුන්ගෙන් අය කරන මුළු මුදලින් 22% ත්, එනම් වසරකට රුපියල් මිලියන 225ක් රුසියාවට ඇදී යනු ඇත. ඒ නිශ්නි නොව්ගොරොඩ් නැමැති රුසියානු විශ්ව විද්‍යාලයේ නමින් උපාධි සහතිකය නිකුත් කිරීම සඳහාය. මෙවන් විශාල මුදලක් වාර්ෂිකව ගලා ඒම ආයතනයක් වශයෙන් විශාල ලාභයක් වන අතර මෙම කුට ව්‍යාපාරයට හවුල් ප්‍රධාන පුද්ගලයන් තිදෙනා ඒ වෙනුවෙන් මහත් සැලකිමකට භාජනය වනු ඇතැයි අප විශ්වාස කරමු.

## 6.3 ශ්‍රී ලාංකීය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනයට කිසිදු දායකත්වයක් නොමැත.

### 6.3.1 යටිතල පහසුකම් දියුණු වීමක් නොමැත

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට ලබාදුන් ව්‍යාජ ලිපියට අමතරව තම සිසුන්ට සායනික පුහුණුව ලබාදෙන රෝහලක් ඉදි කිරීමට මාලඹේ වෛද්‍ය ආයතනය කිසිදු පියවරක් මේ වන විටත් ගෙන නොමැත. නමුත් පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පවතින අනෙකුත් රටවල ඔවුන් සතුව මහජනතාවට නොමිලයේ ප්‍රතිකාර කරන රෝහල් පවත්වාගෙන යන අතර එමඟින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉදිරි ගමනටද අත්වැලක් සැපයේ. උදා : ඉන්දියාව නමුත් මුදල මුල් කරගත් මෙම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය හරහා ශ්‍රී ලාංකීය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනයට හෝ රෝගී ජනතාව සිදුවන සෙතක් නොමැත.

### 6.3.2 සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නව රැකියා අවස්ථා බිහි කිරීමට අත්වැලක් නොමැත.

ඉහත වෛද්‍ය පීඨය සඳහා වෙනම රෝහලක් ඉදි කරන්නේ නම් ඒ හරහා සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ වෛද්‍යවරුන්, හෙදියන් රසායනාගාර ශිල්පීන් වැනි විවිධ කාණ්ඩ සඳහා නව රැකියා අවස්ථා බිහි වීමත් සිදු වේ. එසේම වන තාක්ෂණය හා වෛද්‍ය උපකරණ ගෙන ඒමත් එමගින් රෝගීන්ට පහසුව සැලසීමත් සිදුවනු ඇත. නමුත් එම ආයතනයේ පරිපාලනය යෝජනා කරන අන්දමට රජයේ රෝහලක් මෙම ආයතනය ලබාදීම හරහා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවට කිසිදු පිටිවහලක් නොලැබෙන අතර එය දැනට හොඳින් ක්‍රියාත්මක වන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටළු ඇති වීමට හේතු වනු ඇත.

### 6.3.3 රෝගීන් සඳහා කිසිදු පහසුවක් නොලැබීම

තම රෝගී තත්වයන් මධ්‍යයේ ඉතා අපහසුවෙන් වුවද තම දූ දරුවන්ට මතු කාලයේ ඉහළ සෞඛ්‍ය සේවාවක් ලබාදීමේ උතුම් අරමුණින් පෙරදැරි කරගනිමින් අප රටේ රෝගීන් වෛද්‍ය සිසුන්ට තම සායනික පුහුණුව ලබා ගැනීම සඳහා ඉහළ දායකත්වයක් ලබාදේ. නමුත් තවත් අයෙකුට මිලියන ගණනින් ලාභ ලබා ගැනීමට තම අපහසුතාවන් මධ්‍යයේ ආධාර දීමට අපරටේ ජනතාව පසුබට වනු ඇත. තවද එසේ කිරීම හරහා මෙම රෝගීන්ට ලැබෙන අමතර වාසියක්ද නොමැත.

### 6.4 රජයේ වෛද්‍ය විද්‍යාල සඳහා ඇති බලපෑම

#### 6.4.1 ආචාර්ය මණ්ඩලය හිඟවීම

එක් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම එහි අවසානය නොවන අතර තවත් එවැනි ආයතන රැසක් මෙරට ස්ථාපනය වනු ඇත. දැනටමත් එවැනි ආයතන 78ක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. තවද රජයේ වෛද්‍ය විද්‍යාල මෙන් නොව සිසුන් ආකර්ශනය කරගැනීමේ වැඩපිළිවෙලක් ලෙස මෙම පෞද්ගලික ආයතන කොළඹ හා තදාසන්න ප්‍රදේශ වලට සීමාවනු ඇත. එසේම අධික මිළක් සිසුන්ගෙන් අයකරගැනීම නිසා එහි ආචාර්ය මණ්ඩලයට ඉහළ වැටුප් හා වරප්‍රසාද ලබා දීමට ඔවුන්ට හැකියාව ලැබෙනු ඇත. මේ නිසා ස්වභාවයෙන්ම මෙම ආයතන සඳහා දැනට රජයේ විශ්ව විද්‍යාලයන්ට අයත් ආචාර්යවරුන් ඇදීයාම නොවැළැක්විය හැකි වනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස දැනට ඉහළම ලකුණු ලබා වෛද්‍ය විද්‍යාලයන්ට ඇතුළු වන සිසුන්ට අධ්‍යාපනය ලබා දීමට පළපුරුදු ආචාර්ය මණ්ඩලය අහිමි වනු ඇත.

#### 6:4:2 සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පුරප්පාඩු අඩු ප්‍රමිතියකින් යුතු වෛද්‍යවරුන්ගෙන් සංතෘප්ත වීම

මේ වන විට රාජ්‍ය අංශයට අනුබද්ධිතව වෛද්‍යවරුන් 13,000ක් පමණක් පෞද්ගලික අංශය හා සම්බන්ධව වෛද්‍යවරුන් 4000ක් පමණක් සේවය කරති. තවද මේ වන විටත් රජයේ වෛද්‍ය විද්‍යාල තුල සිසුන් 6000කට වැඩි පිරිසක් අධ්‍යාපනය ලබති. මෙම එක් සිසුවෙක් උදෙසා රජය රුපියල් මිලියන <u>1.8</u> ක් වියදම් කරයි. ඒ අනුව දැනට වෛද්‍ය පීඨයන්හි අධ්‍යාපනය ලබන සිසුන් වෙනුවෙන් රජය රුපියල් මිලියන 108,000 (1.8 × 6000) ආයෝජනය කර ඇත. එතරම් මුදලක් වැය කොට, ඉතා දුෂ්කර පුහුණුවකින් පසුව බිහිවන වෛද්‍යවරුන්ගේ සේවය රටට ලබා ගැනීමට නොහැකි වුවහොත් එය මහජන මුදල් නාස්තියක් පමණක් නොව රටට දැවැන්ත පාඩුවක්ද වනු ඇත.

#### 6:4:3 වෛද්‍ය සිසුන් නොසන්සුන් වීම

පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පිහිටුවීම සම්බන්ධයෙන් මෙරට ඉතිහාසය එතරම් ප්‍රියජනක නොවේ. 1987 සමයේ පිහිටුවීමට කටයුතු කරන ලද උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය කෙළවර වූයේ වෛද්‍ය සිසුන් කිප දෙනෙකු සිය ජිවිත වලින් වන්දි ගෙවමිනි. එමනිසා මෙම ප්‍රමිතියෙන් බාල පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පිහිටුවීම වෛද්‍ය සිසුන් අනවශ්‍ය කලබලයකට පත් කරන තවත් කටුක අත්දැකීමක් වීමට ඇති ඉඩකඩ බොහෝය.

## 7. අධ්‍යාපනික ක්ෂේත්‍රයට ඇති බලපෑම

### 7.1 පැහැදිලි විෂමතාව තුලින් පාසැල් සිසුන් කලකිරීමට පත්වීම

මේ අයුරින් උසස් අධ්‍යාපනයේ ප්‍රමිතිය පහළ යාම හරහා දැනටමත් එහි අභිමුව සිටින පාසල් සිසුන් තුල උසස් අධ්‍යාපන ආයතන පිළිබඳව ඇති විශ්වාසය බිඳ වැටීම වැළැක්විය නොහැක. මෙය තරුණ පරම්පරාව තුල අපේක්‍ෂා භංගත්වයක් ඇති වීමට හේතු වන අතර ඔවුන් නියමිත මාර්ගයේ යාම වෙනුවට වෙනත් කෙටි ක්‍රම හරහා සුදුසුකම් සපුරා ගැනීමට උත්සහ කිරීම තුලින් ප්‍රමිතිය බිඳ වැටීමකට ලක්වනු ඇත. තවද ඔවුන් දේශිය උසස් අධ්‍යාපන පාඨමාලාවන්ට වඩා විදේශිය උපාධි කෙරෙහි විශ්වාසය තැබීමට පෙළඹෙනු ඇත.

## 8. දැනට බඳවාගෙන ඇති සිසුන්ගේ හා ඔවුන්ගේ උගත් දෙමාපියන්ගේ වගකීම් විරහිත හැසිරීම් රටාව

### 8.1 රජයේ රෙගුලාසි සඳහා අවනත නොවීම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව නිරන්තරයෙන් පුවත්පත් දැන්වීම් හරහා මෙම මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනයට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අනුමැතිය නොමැති බවත් එම නිසා ඉන් බහිවන සිසුන්ට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් පවත්වන Act 16 විභාගයට පෙනී සිටීමට නොහැකි බවත් දැනුම් දී ඇත. නමුත් පුදුමයට කරුණ වන්නේ වෛද්‍ය අධ්‍යාපනය ලැබීම සඳහා ඉහළ බුද්ධි මට්ටමක් තිබේ යැයි සිතන සිසුන් පිරිසක් හා ඔවුන්ගේ උගත් දෙමාපියන් ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටත කිසිදු පිළිගැනීමක් නොමැති මෙම ව්‍යාජ වෛද්‍ය ආයතනයේ මුදල් ගෙවා ලියාපදිංචි වී මෙම වංචාවට හසුවීමය. රජයේ අවවාද නොතකමින් තම මුදල් හා කාලය නිකරුණේ ව්‍යාජ ආයතනයකට යොදවා මෙම සිසුන් හා දෙමාපියන් ඉතා විශාල අවදානමකට වුවමනාවෙන් ලක් වී ඇති අතර පූර්ව දැනුවත් කිරීම හරහා රජය ඔවුන්ගේ එම ක්‍රියාවලිය සම්බන්ධයෙන් වගකීමෙන් නිදහස් වී ඇත.

### 8.2 සිසුන් බඳවාගෙන කලක් ගත වීමෙන් පසු ලබා ගන්නා අනුමැතිය මුලින් බඳවාගත් සිසුන් කෙරෙහි බල නොපාන බව

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව දක්වන ආකාරයට වෛද්‍ය ආයතනයක් සඳහා අනුමැතිය ලබා ගත යුත්තේ ඊට සිසුන් බඳවා ගැනීමට පෙරයග ඉන්දියානු වෛද්‍ය සභාව පවා දක්වන ආකාරයට මෙලෙස සිසුන් බඳවා ගැනීමෙන් පසුව අනුමැතිය ලබා ගැනීමට උත්සහ කිරීම හරහා එහි ප්‍රමිතිය බිඳවැටීමකට ලක්වනු ඇත. එම නිසා අනාගතයේදී මාලඹේ වෛද්‍ය ආයතනය කුමන හෝ ආකාරයට අනුමැතිය ලබා ගත්තද මෙතෙක් ඉන් අධ්‍යාපනය ලැබූ සිසුන්ට එය අදාල වන්නේ නැත. එම නිසා ඔවුන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යටතේ ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන්නේ නැත.

**යෝජනා**

පෞද්ගලික වෛද්‍ය විද්‍යාල මෙරට පිහිටුවීම රටේ ආර්ථිකය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, අධ්‍යාපන ක්ෂේත්‍රය ඇතුළු විවිධ පැතිකඩයන්ට බලපාන මාතෘකාවක් බැවින් මෙවන් තීන්දු තීරණ ගැනීමට පෙර අදාළ සියලු පාර්ශවයන් ඇතුලත් වන පරිදි පත්කරන ලද කමිටුවක් හරහා තත්ව වාර්තා ලබා ගනිමින් දුරදිග බලාගත යුතු තීන්දු තීරණ වේ.

වෛද්‍ය ආයතනය හා වෛද්‍ය සේවාවේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම නීතියෙන් බැඳී ඇති ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තව තවත් ශක්තිමත් හා බලාත්මක වන පරිදි කටයුතු කළ යුතුව ඇත.

# SRI LANKA MEDICAL COUNCIL

**31, NORRIS CANAL ROAD, COLOMBO -10**

*In reply please quote MCI*



**President**
Dr. H.H.R. Samarasinghe
MB.BS (Cey.), MD (Cey.),
FRACP, FRCP (Lond.)

**Vice-President**
Dr. Ananda Samarasekera
MD, MB BS, DLM,
DMJ (Lond.),
Dip. FM. (Glasgow),

**Registrar**
Dr. N.J. Nonis
MBBS (Cey), MRCP (UK).

**Asst. Registrar**
Dr H.M.S.S.D. Herath
MBBS (Cey.), FRCP (Edin.),
MRCP (UK), MRCP (Irel.),
DTPH (Lond.) DIH (Eng.),
MFOM (Lond.)


28th May 2009.

Dr.Neville Fernando,
President,
South Asian Inst: of Tech: & Mgmnt (Pvt) Ltd,
147/2, Senanayake Mawatha,
2nd Lane , Nawala.

Dear Dr.Fernando,

**Request for recognition of the 4 years of study for M.D. Nizhny Novogorod State Academy of Medicine Russian Federation.**

This is in reply to your letter of 27 /5 / 2009 , regarding the above.

The Sri Lanka Medical Council has **recognized the degree awarded by Nizhny Novogorod State Medical Academy of Russian Federation, for the course of study conducted in Russia where the period of the course is six years.**

The **Sri Lanka Medical Council (SLMC) has not recognized** any other programme conducted in Sri Lanka or elsewhere by the **Nizhny Novogorod State Medical Academy Russsian Federation.**

**Regulations for Prescribed Standards for recognition of institutions awarding degrees other than a University established or deemed to have been established by the Higher Education Act no.20 of 1966 have been gazetted but have still not been passed by our Parliament.**

I must state the obvious viz that the SLMC has no power to place these regulations before Parliament.

**When these regulations are passed by Parliament,** you could apply to the SLMC.At that stage the SLMC will visit your institution to ascertain whether your institution meets the standards prescribed and then decide whether to recognize or not recognize your institution.

Yours faithfully,

Dr. H.H.R. Samarasinghe.
President.
SLMC.


**Telephone No.: 2691848** **Fax No.: 2674787**
**E-mail: slmc @ lankabellnet.com** **Web site: www. slmedc.lk**

Dr. Neville Fernando - M.B.B.S(Ceylon)
Tel : 2788341- Office,
2805120 - Residence,
2789933/4 - JF&I Printers Office

No.147/2, Senanayake Mawatha,
2nd Lane,
Nawala.

To Council

The President

Sri Lanka Medical Council

30 Norris Canal Road

Colombo. 8

Dear Sir

Approval to commence a private

Medical College in Malabe

Asian Institute of Technology and Management is a BOI approved project to set up a higher education institute on 3.5 acres of land and Malabe. Health science is one of the fields approved.

Recently I had a discussion with Hon Wishva Warnapala who revealed the fact that of the 210,000 who sit the "A" level exam 100,000 qualify to enter the University but for reasons of accommodation of all these students only 19,500 are selected for admission. This is a tragic situation not oly for the student and his /her parents but also for the country to leave out intelligent students out of higher education. I know the desperate state of the parents who do their best to find places for their children in universities abroad.

This is so specialy in medicine. Children are sent to unheard of place all over the world to unkown places with extreme change of weather, culture, language and racial bias.

Some students return from Russia without having touched a single patient.

It is considering this sad fact and knowing that the government cannot increase the intake that I gave considerable thought this and put myself in the position of the student and his parents that I decided to commence a private medical college without any support by way of finance, facilities or other privileges.

I will invest Rs 500 million of my money without seeking a return on capital to minimize the cost to the students,

The fees charged by foreign Universities range from British Pounds 3500 per year or Sri lankan Rs7 million to Rs 20 million in Manipal and Bangladesh .Other countries other countries charge

less. In addition living costs, accommodation and expenses like airfare and the mental agony have to be added to this.

I will get the best Professors and lecturers not only from Sri Lanka but from UK and Australia.

Sri Lankans from the local universities will not be employed unless they on sabbatical leave

. will charge affordable fees and also construct a 400 bed non paying hospital . It will be the most modern hospital with five operating theatres, including heart surgery, brain surgery orthopaedics and general surgery. There will be a psychiatric ward and all the other spec ties

ICU's and emergency rooms will be available. A detailed list will be sent later.

I seek your assistance and cooperation tou recognize our organization.

Thanking you

Yours faithfully

Dr.Neville Fernando MBBS(Cey)

# SRI LANKA MEDICAL COUNCIL

## NOTICE TO THE PUBLIC

### REGARDING MALABE MEDICAL COLLEGE OF THE SOUTH ASIAN INSTITUTE OF TECHNOLOGY AND MANAGEMENT

As a followup to our previous newspaper notices published in October 2009, the Sri Lanka Medical Council states as follows :

Whereas the South Asian Institute of Technology and Management (SAITM) has claimed by way of newspaper advertisements etc. with regard to the Malabe Medical College that the programme will be closely monitored by the Sri Lanka Medical Council (SLMC).

THE SRI LANKA MEDICAL COUNCIL WISHES TO INFORM THE PUBLIC THAT THERE IS NO LEGAL PROVISION UNDER THE MEDICAL ORDINANCE (CHAPTER 105) FOR THE SLMC TO MONITOR THE MEDICAL EDUCATION PROGRAMME AT THE MALABE MEDICAL COLLEGE OF SAITM OR TO RECOGNISE THE DEGREE THAT MAY BE AWARDED AT THE END OF THAT PLANNED MEDICAL EDUCATION PROGRAMME.

**Dr N.J. Nonis**
**Registrar,**
**Sri Lanka Medical Council,**
**On the directions of the Council**
**31, Norris Canal Road,**
**Colombo 10.**

'Daily News'
22. 02. 2010

# NOTICE

## SRI LANKA MEDICAL COUNCIL

The method of determining the Rank Order of medical graduates **qualified in Sri Lanka** for appointment as Intern House Officers has been finalised.

In this context, it would be necessary to formulate a scheme for determining the merit position of **medical graduates qualified abroad.** The Council has formulated such a scheme at the request of the Ministry of Health taking into consideration. 1. Performance at the Examination for Registration to Practice Medicine (Act 16 exam) 2. Government Scholarships.

This would come into effect from 1st June 2006.

Registrar,
Sri Lanka Medical Council
31, Norris Canal Road, Colombo 10.

# SRI LANKA MEDICAL COUNCIL

# NOTICE TO THE PUBLIC

## REGARDING MALABE MEDICAL COLLEGE OF THE SOUTH ASIAN INSTITUTE OF TECHNOLOGY AND MANAGEMENT

As a follow up to our previous newspaper notices published in October 2009, the Sri Lanka Medical Council states as follows:

Whereas the South Asian Institute of Technology and Management (SAITM) has claimed by way of newspaper advertisement etc. with regard to the Malabe Medical College that the programme will be closely monitored by the Sri Lanka Medical Council (SLMC)

THE SRI LANKA MEDICAL COUNCIL WISHES TO INFORM THE PUBLIC THAT THERE IS NO LEGAL PROVISION UNDER THE MEDICAL ORDINANCE (CHAPTER 105) FOR THE SLMC TO MONITOR THE MEDICAL EDUCATION PROGRAMME AT THE MALABE MEDICAL COLLEGE OF SAITM OR TO RECOGNISE THE DEGREE THAT MAY BE AWARDED AT THE END OF THAT PLANNED MEDICAL EDUCATION PROGRAMME.

Dr. N. J. Nonis<br>
Registrar, Sri Lanka Medical Council,<br>
On the directions of the Council<br>
31, Norris Canal Road, Colombo 10.

# NOTICE

## SRI LANKA MEDICAL COUNCIL

The method of determining the Rank Order of medical graduates **qualified in Sri Lanka** for appointment as Intern House Officers has been finalised.

In this context, it would be necessary to formulate a scheme for determining the merit position of **medical graduates qualified abroad.** The Council has formulated such a scheme at the request of the Ministry of Health taking into consideration. 1. Performance at the Examination for Registration to Practice Medicine (Act 16 exam) 2. Government Scholarships.

This would come into effect from 1st June 2006.

Registrar,
Sri Lanka Medical Council
31, Norris Canal Road, Colombo 10.

24-03-2010

ලංකාදීප

15

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# මහජනයා වෙත දැනුම් දීමයි

## දකුණු ආසියාතික තාක්ෂණ විද්‍යා හා කළමණාකරණ ආයතනයේ මාලබේ වෛද්‍ය විද්‍යාලය සම්බන්ධවයි.

වර්ෂ 2009 ඔක්තෝබර් මස පළකරන ලද පුවත්පත් නිවේදනයෙන් අනතුරුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මෙසේ දන්වා සිටී.

දකුණු ආසියාතික තාක්ෂණ හා විද්‍යා හා කළමණාකරණ ආයතනය (SAITM) මගින් මාලබේ පිහිටුවා ඇති වෛද්‍ය විද්‍යාලය ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අධීක්ෂණය කරනු ලබන බවට පුවත්පත්වල දැන්වීම් පළ කර ඇති හෙයින්,

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව. මහජනයා වෙත දැනුම් දෙනු ලබන්නේ වෛද්‍ය ආඥා පනත (105 පරිච්ඡේදය) අනුව මෙම සභාවට මාලබේ වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය අධ්‍යාපන වැඩසටහන අධීක්ෂණය කිරීමට හෝ ඉන් අනතුරුව ප්‍රදානය කරනු ලබන උපාධිය පිළිගැනීමට හෝ නෛතික විධිවිධාන නොමැති බවයි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නියමය පරිදි.
වෛද්‍ය එච්.ජේ. නෝනිස්.
ලේඛකාධිකාරී.
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව.
31. නොරිස් කැනල් පාර. කොළඹ 10.

# Nizhny Novgorod State Medical Academy Russian Federation, Sri Lanka Campus

## *Vacancies for*

## *Consultants, Professors, Senior Lecturers and Lecturers*

*Qualifications and appointments on U.G.C. guidelines.*


- **Human Anatomy**
- **Physiology**
- **Pathological Anatomy**
- **Microbiology, Virology and Immunology**
- **Biochemistry**
- **Psychology & Medical psychology**
- **Medical Physics**
- **Community Medicine**
- **Biology and Ecology**
- **Nursing care**
- **Pharmacology**
- **Medicine**
- **General Surgery, Anesthesiology**
- **Pathological Physiology**
- **Physical training**
- **Russian language**
- Assistant Coordinator & Computer Applications Assistant

  Persons with good working knowledge in English, computer literate, and at least 1 year work experience in an office environment is required. A/L qualifications in science and other qualifications will be advantageous.

***Please submit CV's with names of 2 referees and a recent photograph, on or before August 30, 2010 to the Registrar, P.O. Box 11, Malabe. The Management reserves the right interview short listed applicants.***

- Our academy is approved by the Ministry of Public Health, Russian Federation.
- Those on Sabbatical Leave from Universities or who prefer to work during weekends are invited to apply.
- At the Sri Lankan Campus academic programs from Saturday to Thursday.
- At present after one year of existence we have 90 students.
- We have the cream of London and Cambridge students, International Baccalaureate and Sri Lankan A/L students who just failed by a few marks to enter State Universities.

***Next Intake of Students is September 15th 2010. Interviews are now on for students with A/L's on U.G.C. guide lines.***



**Nizhny Novgorod State Medical Academy Sri Lanka Campus,**

Millennium Drive, off New Kandy Road, Malabe.

INVESTMENT DEPARTMENT

BOI
SRI LANKA

BOARD OF INVESTMENT OF SRI LANKA

World Trade Center
West Tower
Echelon Square
Colombo 1
Sri Lanka

Date: 09.08.2010
Our Ref:
Your Ref: EC/4/9823/08

Professor Lalitha Mendis
President SLMC
**Sri Lanka Medical Council**
31, Norris Canal Road,
**Colombo 10**

Dear Madam,

**SOUTH ASIAN INSTITUTE OF TECHNOLOGY AND MANAGEMENT (PVT) LTD., (SAITEM)**

I refer to your letter dated 29th July 2010 on the above subject and wish to respond to the questions raised therein as follows:

1. **When was SAITM approved as a BOI project?**

Dr. Neville Fernando Investment Company (Pvt) Ltd., was granted approval on 31st March 2008 to set up a Higher Education Institute to provide Training Programmes in the following areas with an envisaged investment of US$. 5 Million.

- Information Technology
- Management and Finance
- Engineering
- Vocational Studies
- Nursing
- Languages
- Health Science

This approval was granted subject to the condition that the approval from Ministry of Health and Nutrition be obtained prior to providing training in Health Science.

Subsequently, on a request made by Dr. Neville Fernando, the company was granted approval to change the main investor as Dr. Neville Fernando instead of Dr. Neville Fernando Investment Company (Pvt) Ltd. SAITEM signed the Agreement with the BOI on 1st October 2008. At present the company is in operation.

..2

Tel: 2434403-5, 2346338, 2431209, 2448105, 2434342
2439659, 2438972, 2346339 Fax: 94-1-2447995, 2346629 Cables: ECONCOM COLOMBO
Internet: http: //www.boisrilanka.org

BOI SRI LANKA

2. **Did the application include a proposal to set up a medical school ?**
   No

3. **Was the application submitted jointly with the Nizhny Novgorod State Medical Academy (NNSMA) of Russia to set up an off shore campus in Sri Lanka ?**
   No, as indicated above, this is a 100% locally owned venture.

4. **Is there a separate BOI application by the NNSMA to set up an off shore campus in Sri Lanka ?**
   No

5. **Was the SAITM application referred for scrutiny to an educational authority ? If so – which educational authority?**
   No

6. **Has this authority replied ?**
   **If so, is there any reference to a medical school in the reply ?**
   Not applicable.

7. **Please provide any other relevant information**
   Dr. Neville Fernando Investment Company (Pvt) Ltd., by their letter dated 21st May 2008 had informed the BOI that he had requested the Hon Minister of Health, President, Sri Lanka Medical Council and the Chairman, University Grant Commission to permit him to commence a private medical college and had forwarded the copies of the letters sent to them.

   By letter dated 26th January 2009, Dr. Neville Fernando had informed that they had been able to affiliate with a prestigious University in Russia, namely, Nizhny Novgorod State Medical Academy to offer Doctor of Medicine (M.D) Degrees. Further, he had informed that the degree (M.D) had already been recognized by the SLMC and the General Medical Council of the United Kingdom and the World Health Organization.

Yours faithfully,
**BOARD OF INVESTMENT OF SRI LANKA**

J. D Bandaranayake
CHAIRMAN/DIRECTOR GENERAL

cc : Dr. Neville Fernando

Dr. Neville Fernando - M.B.B.S(Ceylon)
Tel : 2788341- Office,
2805120 - Residence,
2789933/4 - JF&I Printers Office

No.147/2, Senanayake Mawatha,
2nd Lane,
Nawala.

The President

Sri Lanka Medical Council

30 Norris Canal Road

Colombo. 8

Dear Sir

Approval to commence a private

Medical College in Malabe

Asian Institute of Technology and Management is a BOI approved project to set up a higher education institute on 3.5 acres of land and Malabe. Health science is one of the fields approved.

Recently I had a discussion with Hon Wishva Warnapala who revealed the fact that of the 210,000 who sit the "A" level exam 100,000 qualify to enter the University but for reasons of accommodation of all these students only 19,500 are selected for admission. This is a tragic situation not oly for the student and his /her parents but also for the country to leave out intelligent students out of higher education. I know the desperate state of the parents who do their best to find places for their children in universities abroad.

This is so specialy in medicine. Children are sent to unheard of place all over the world to unkown places with extreme change of weather, culture, language and racial bias.

Some students return from Russia without having touched a single patient.

It is considering this sad fact and knowing that the government cannot increase the intake that I gave considerable thought this and put myself in the position of the student and his parents that I decided to commence a private medical college without any support by way of finance, facilities or other privileges.

I will invest Rs 500 million of my money without seeking a return on capital to minimize the cost to the students,

The fees charged by foreign Universities range from British Pounds 3500 per year or Sri lankan Rs7 million to Rs 20 million in Manipal and Bangladesh .Other countries other countries charge less. In addition living costs, accommodation and expenses like airfare and the mental agony have to be added to this.

I will get the best Professors and lecturers not only from Sri Lanka but from UK and Australia.

Sri Lankans from the local universities will not be employed unless they on sabbatical leave

. will charge affordable fees and also construct a 400 bed non paying hospital . It will be the most modern hospital with five operating theatres, including heart surgery, brain surgery, orthopaedics and general surgery. There will be a psychiatric ward and all the other specialties

ICU's and emergency rooms will be available. A detailed list will be sent later.

I seek your assistance and cooperation tou recognize our organization.

Thanking you

Yours faithfully

Dr.Neville Fernando MBBS(Cey)

479:8.1

SAITM
Education with Character
South Asian Institute of Technology and Management

To council
[handwritten initials]

DR. H.H.R. SAMARASINGHE
PRE...
SRI LAN...

Dr.H.H.R. Samarasingha. MD. FRCP

President

Sri Lanka Medical Council

Noris Canal Road

Colombo.8

Dear Dr Samarasinga

Thank you very much for meeting me with Prof Bulanov Vice chancellor Nizhny Novgrod State Academy of Medicine Russia and Prof Vladimir regarding the setting up of the Malabe campus of their University to award the degree of Doctor of Medicine. The duration of the course will be 5 years with 4 years being in Sri Lanka and final year in Russia.

The degree is already recognized by the SLMC and the GMC.

Since part of the course will be delivered in Sri Lanka I write to find out what conditions have to be met with.

We have already signed the MOU.

We will supply all the information that you need

Thanking you

Yours sincerely

Dr.Neville Fernando. MBBS (Ceylon)

President

16th Feb 2009

403/1, Hokandara Road, Hokandara South, Sri Lanka.
Tel: +(94) 115748442/3, e-mail : sneville@sltnet.lk